සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Department of Education - Sabaragamuwa Province

# මධ්‍යවාර පරීක්ෂණය - 2021

7 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය පැය 02

නම ඃ- .................................... විභාග අංකය ඃ- .....................

**ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) පෘථිවි ආදර්ශ ගෝලයේ උත්තර ධ්‍රැවයේ සිට දක්ෂිණ ධ්‍රැවය දක්වා විහිදී ඇති රේඛා හඳුන්වන්නේ,

i අක්ෂාංශ ලෙසය ii දේශාංශ ලෙසය
iii සමකය iv ධ්‍රැවය

2) පෘථිවියට සූර්යයා වටා පරිභ්‍රමණය වීමට ගතවන කාලය

i දින 360 පැය 6යි ii දින 366 පැය 4

iii දින 365 පැය 6 iv දින 365 පැය 4

3) මහද්වීප අතර පිහිටි විශාල ජල තල ප්‍රදේශ හඳුනවන්නේ

i සාගර නමිනි ii මුහුදු නමිනි

iii ගංගා නමිනි iv පොකුණු නමිනි

4) ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැනිතලාවේ දක්නට නොලැබෙන භූ දර්ශනයක් වන්නේ

i තුඩු ii බොකු

iii කලපු iv දියඇලි

5) අශ්පෘශ්‍ය උරුමයක් වන්නේ

i ඉසුරුමුණිය ii සිංහරාජය

iii සිරිත් විරිත් iv කෝනේශ්වරම් කෝවිල

**ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

6) ආසන්න වටා පිටාවේ ඇති ගොඩබිම් සාගර පදනම් කරගෙන රටක පිහිටීම දැක්වීම ........................... පිහිටීම වේ.

7) ශ්‍රී ලංකාව ........................... කලාපයේ පිහිටි රටකි.

8) සීගිරිය දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ ........................... කළාපයේය.

9) සිංහරාජ වනාන්තරය ........................... නිර්මිතයකි.

10) ශ්‍රී ලංකාවේ පළල ගණනය කරනු ලබන්නේ කොළඹ සිට ........................... දක්වාය.

( වියළි, සාපේක්ෂ, ස්වභාවික, සන්ගමන්කන්ද තුඩුව, නිවර්තන)

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද වැරදිනම් ( x )ලකුණද වරහන් තුළ යොදන්න.**

11) ශ්‍රී ලංකාවේ වානිජ නගරය වූ කොළඹ පිහිටා ඇත්තේ තෙත් තලාපයේය. ( )

12) පකිස්ථානය දකුණු ආසියානු කලාපයට අයත් රටකි. ( )

13) රන්මසු උයන ස්වභාවික නිර්මිතයකි. ( )

14) පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකාවට වියළි කාලගුණයක් පවතී. ( )

15) ශ්‍රී ලංකාවට ඊසාන දිග මෝසම් ලැබෙන්නේ මැයි, ජූනි, ජූලි මාසවලය. ( )

ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා A කොටසට ගැලපෙන පිළිතුර B කොටසින් තෝරා අදාළ අක්ෂරය වරහන තුළ ලියන්න.

| A | | B |
|---|---|---|
| 16) ගිගුරුම් සහිත තද වර්ෂාවකි. | ( ) | a) කැස්පියන් |
| 17) ආසියානු මහද්වීපයට අයත් මුහුදකි. | ( ) | b) මාලදිවයින |
| 18) කුඩාම මහද්වීපය වේ. | ( ) | c) **සංවහන** |
| 19) තල් ගස් බහුලව දක්නට ලැබෙන ප්‍රදේශයකි. | ( ) | d) **වියළි කලාපය** |

20) දකුණු ආසියාවේ සමාජ සංවර්ධනය ඉහළම රටකි. (     )     e) යාපනය අර්ධද්වීපය හා යාබද දූපත්

f) ඕස්ට්‍රේලියාව

## ii කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.
  (පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 05කි.)

01) ඔබට සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න.

i) ග්‍රීන්ලන්තය     ii) රතු මුහුද     iii) මාල දිවයින

iv) උතුරු ඇමරිකාව     v) නේපාලය     vi)ග්‍රිනිච් මධ්‍ය රේඛාව (ල 12)

02) i) අක්ෂාංශ රේඛා යනු කුමක්දැයි හඳුන්වන්න. (03)

ii) ලෝකයේ සාගර 04ක් ලියා දක්වන්න. (04)

iii) ලෝකයේ මහද්වීප 05ක් ලියා දක්වන්න. (05)

03) i) දකුණු ආසියාවට අයත් රටවල් 03ක් ලියා දක්වන්න. (03)

ii) ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය ඉයළ යෑමට බලපෑ කරුණු 04ක් ලියන්න. (04)

iii) හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමෙන් අපට ලබාගත හැකි වාසි 05ක් ලියන්න. (05)

04) i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූවිෂමතා කලාප 03 මොනවාද? (03)

ii) වෙරළට හානි ගෙන දෙන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (04)

iii) මධ්‍යම කඳුකරයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ 05ක් දක්වන්න. (05)

05) i) ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග නම් කරන්න. (03)

ii) පහත වගුව සම්පූර්ණ කරන්න. (04)

| ආගම | සංස්කෘතිකාංග/උත්සව |
|---|---|
| බෞද්ධ | |
| හින්දු | |
| ඉස්ලාම් | |
| කතෝලික | |

iii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ලෝක උරුම 05ක් ලියන්න. (05)

06) i) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම තුන මොනවාද? (03)

ii) ශ්‍රී ලංකාවට වියළි කාලගුණයක් ලැබෙන මාස දෙක නම් කරන්න. (04)

iii) වාසුලි වර්ෂාවේ ස්වභාවය පැහැදිලි කරන්න. (05)

i) වාසුලි වර්ෂාව ලැබෙන මාස-

ii) වාසුලි වර්ෂාව ඇති වීමට හේතුව-